www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නව සිංහල අන්තවාදී පක්ෂයෙන් ශ්‍රී ලංකාවේ මැතිවරනයට බෞද්ධ භික්ෂුන් ඉදිරිපත් කෙරේ

## New Sinhala extremist party fields Buddhist monks in Sri Lankan elections

**පානිනී විජේසිරිවර්ධන සහ කේ රත්නායක විසිනි**
**2004 අප්‍රේල් 01**

"සාම ක්‍රියාදාමය" ට එරෙහි ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ ස්වෝත්තමවාදී උද්ඝෝෂනය සහ එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුවේ ක්‍රියා කලාපය හේතුවෙන් රට නැවත යුද්ධයට ඇද දැමීමේ පීඩනය එල්ල කරනු ලබන අන්තරායකාරී වාර්ගික බලවේග ක්‍රියාත්මක විය හැකි බවට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සහ ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය නැවත නැවතත් අනතුරු අඟවා ඇත.

පෙබරවාරි 7දා කුමාරතුංග විසින් එජාපෙ ආන්ඩුව නෙරපා හැරීමෙන් පසු එළැඹුනු දින කීපය තුල ජාතික හෙළ උරුමය (ජාහෙඋ) පිහිටුවීමෙන් මෙම අනතුරු ඇඟැවීම බලගතු ලෙස සනාථ කෙරී ඇත. සිහල උරුමය (සිඋ) සහ එහි සහායකයෙකු ලෙස ක්‍රියාත්මක වූ ජාතික සංඝ සම්මේලනය (ජාසස) නම් වූ අන්ත දක්ෂිනාංශික සංවිධාන දෙක එකතු කොට ජාහෙඋ ස්ථාපනය කරනු ලැබුවේ ජනාධිපතිනිය සහ සමස්ත දේශපාලන සංස්ථාපිතය තව දුරටත් දකුනට තල්ලු කිරීම සඳහා ය.

ජාහෙඋ, ඉතා පැහැදිලිවම, සිංහල-බෞද්ධ අධිකාරවත් වැඩපිලිවෙලක් මත මෙවර මැතිවරනයේ දී, මැතිවරන දිස්ත්‍රික්ක 22න් 21ට ම තරඟ කරමින් බෞද්ධ භික්ෂුන් 252ක් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කර ඇත. එජාපෙ හා දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර පැවැත්වූ සාම සාකච්ඡා පිලිබඳව, අවශ්‍ය තරම් දැඩි පිලිවෙතක් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් ජාහෙඋ, කුමාරතුංගගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) විවේචනය කරයි.

ජාහෙඋයේ විවේචන මගින් කුමාරතුංගගේ අස්ථායී තුලිතකරනය අනාවරනය කෙරී ඇත.

එල්ටීටීඊයට අවශ්‍ය ප්‍රමානයට වඩා සහන ලබා දෙන්නේ යැයි ජනාධිපතිනිය එජාපෙට පහර ගහන අතරතුර ම, 20 අවුරුදු සිවිල් යුද්ධය සාකච්ඡාමය විසඳුමකින් නිමා කරන ලෙස බලපෑම් යොදන ප්‍රධාන බලවතුන්ගෙන් සහ මහ ධනපතියන්ගෙන් දුරස්ථ නොවීමට ද වග බලා ගනී. එජනිසයේ වැඩපිලිවෙල, වත්මන් සටන් විරාමය දිගටම පවත්වා ගෙන යාම සඳහා සහ එල්ටීටීඊය සමග තමාගේම සාකච්ඡා ආරම්භ කිරීම සඳහා, දොරගුලු විවර කර සිටී.

අනෙක් අතට ජාහෙඋ, සාමසාකච්ඡා යලි ආරම්භ කිරීමේ කවර හෝ ප්‍රයත්නයකට එරෙහි වේ. සිඋ හා ජාසස සටන් විරාම කොන්දේසි සම්බන්ධයෙන් නැවත නැවතත් දෝෂාරෝපනය කරමින් නෝර්වීජියානු අතරමැදියන් එල්ටීටීඊ හෙන්චයියන් ලෙස හෙලා දුටුවෝ ය. මේ සමගම යුද්ධයට සූදානම්වීම සඳහා ශ්‍රී ලංකාවේ මිලිටරිය ශක්තිමත් කරන ලෙස හඬතැලූහ. එජාපෙ ආන්ඩුව නෙරපා හැරීම සම්බන්ධයෙන් ජාසස කුමාරතුංග අනුමත කල නමුත් එජනිසට තම සහාය පලකිරීම් කොන්දේසි සම්බන්ධ සාකච්ඡාවක් ඉල්ලා සිටියේ ය. ඒ සම්බන්ධයෙන් ඇය ප්‍රමාද වූ විට පීඩනය ඉහල නැංවීම සඳහා ජාසස නායකයෝ ජාහෙඋ පිහිටුවා ගත්හ.

ජාහෙඋයේ ක්‍රමවේදය බියවැද්දීම සහ මැරකමයි. පසුගිය සැප්තැම්බරයේදී සහ ඔක්තෝබරයේදී ජාසස-සිඋ අතිශය ප්‍රකෝපකාරී විරෝධතා දෙකක් සංවිධානය කලහ:

නැගෙනහිර පලාතේ එල්ටීටීඊය විසින් පාලිත ප්‍රදේශයේ බෞද්ධ සිද්ධස්ථානවල නටබුන් සෙවීමේ "පරීක්ෂනයක්" සහ මඩකලපුවේ එල්ටීටීඊයේ කඳවුරක් වෙත පාගමනක්, මේ විරෝධතාවන් දෙක තුලම එල්ටීටීඊය සමග ප්‍රචන්ඩ ගැටුමක් ඇති කර ගැනීමේ විභවය ගැබ්ව තිබින.

මීට අමතරව, ජාසස-සිඋ, මිෂනාරි ආයතනයන් සහ ඊනියා සදාචාර විරෝධී ආගම් වෙනස් කිරීම් තහනමට ලක් කරන ලෙස ඉල්ලමින් දරුනු ක්‍රිස්තියානි විරෝධී උද්ඝෝෂනයක යෙදී ගත්හ. ආගම්වලට හරවා ගැනීමේ මාධ්‍යයන් ලෙස දුප්පතුන්ට ශුභසාධන සහ අධ්‍යාපන වැඩ සටහන් පිරිනමන බවට බෞද්ධ ධුරාවලිය විසින් ක්‍රිස්තියානි කන්ඩායම්වලට චෝදනා කරන ලදී. පසුගිය හය මාසය තුල කොලඹ සහ රටේ අනෙකුත් ප්‍රදේශවල පිහිටි සියයකට අධික පල්ලි සංඛ්‍යාවක් සහ විවිධ ක්‍රිස්තියානි ආයතන මැර ප්‍රහාරවලට ලක් විය. ප්‍රහාරවලට ගොදුරු වූ කීප දෙනෙක් ම, මෙම ප්‍රහාරවලදී බෞද්ධ භික්ෂුන් සෘජුව ම සම්බන්ධ වූ බවට චෝදනා කලහ.

මෙම ක්‍රිස්තියානි විරෝධී උද්ඝෝෂනයේ නායකයෙකුවූ ගංගොඩවිල සෝම නම් වූ භික්ෂුව පසුගිය දෙසැම්බරයේදී රුසියාවේ සංචාරයක යෙදී සිටිය දී හදිසියේ මියයාමත් සමගම මෙම උද්ඝෝෂනය

වඩාත් වියරු සහගත මට්ටමකට නැංවින. කිසිදු සාක්ෂියකින් තොරව ම, ක්‍රිස්තියානුවන්ගේ පාර්ශ්වයේ කුමන්ත්‍රනයක ප්‍රතිඵලයක් ලෙස සෝමගේ මරනය සිදුවූ බවට චෝදනා කරමින් ජාසස-සිළ පල්ලිවලට එල්ල කෙරෙන ප්‍රහාර සහ ජනාධිපතිට සහ ආන්ඩුවට යොදන පීඩනය ඉහල තලයකට නැංවූහ. "සදාචාර විරෝධී ආගම් මාරුකිරීම්" නිමාවකට ගෙන ඒම ජාහෙළයේ ප්‍රධාන ඉල්ලීම්වලින් එකක් විය.

අතෘප්තියට පත්ව සිටින කුඩා ව්‍යාපාරික ස්තරයන්ට, ගොවීන්ට සහ රාජ්‍ය යන්ත්‍රයට බෞද්ධාගමේ සහ සිංහල බහුතරයේ අධිකාරය මත පිහිටුවනු ලබන රාජ්‍යයක් සම්බන්ධයෙන් ජාහෙළ, ප්‍රතිගාමී ආයාචනයක් කලේ ය. එහි වැඩපිළිවෙල මගින් අනෙකුත් ආගම්වලට සහ ජනවාර්ගික සුලුතරයන්ට, විශේෂයෙන් දෙමල ජනතාවට, එරෙහි වෙනස්කම් වඩාත් වැඩිදියුනු කරනු ඇත.

ජාහෙළ ප්‍රධාන ලේකම් උඩුවේ ධම්මාලෝක මෙසේ පැවැසී ය: "අපි මෙම උද්ඝෝෂනය මැතිවරන තරඟයක් ලෙස නොදකින අතර මෙය, බුද්ධ ශාසනයේ ආරක්ෂාව සඳහා සහ අපේ රට සතුරන්ගේ අතට පත්වීම වැලැක්වීම සඳහා ගත් පියවරක්." පාලක ප්‍රභූවේ වඩාත් මිලිටරිමය ස්ථරයන්ගේ ආකල්පයන් පිලිබිඹු කරමින් හමුදාවේ අතීත පරාජයන් "දේශපාලන මැදිහත්වීම්" හේතුවෙන් සිදුවූ බවට චෝදනා කරමින් එල්ටීටීඊය විනාශ කිරීම සඳහා මිලිටරියට නිදහස ලබා දියයුතු බවට ජාහෙළ යෝජනා කරයි.

ජාහෙළ මාර්තු 02 දා, මහනුවර පැවැත්වූ රැස්වීමේ දී තම වැඩපිළිවෙල ඉදිරිපත් කලේ ය.

තම සිංහල බෞද්ධ අධිකාරවත් රාජ්‍යය පිලිබඳ කැඳවුම මතු කෙරෙන පරිදි සිතාමතාම මෙම දිනය සහ ස්ථානය තෝරා ගනු ලැබ ඇත. බ්‍රිතාන්‍යයන්ට යටත් වීමට පෙර පැවති අවසන් සිංහල රාජධානියේ අග නගරය මහනුවර වන අතර, බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ පාලනය විධිමත් ආකාරයෙන් අරඹනු ලැබුවේ 1815 මාර්තු 02 දා අත්සන් කරනු ලැබූ උඩරට ගිවිසුමෙනි. රැස්වීමට ප්‍රථම ජාහෙළයේ භික්ෂූන් විසින්, ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය තුල මූලික ක්‍රියාකලාපයක් ඉටුකල දලදා මාලිගාව අසල ආගමික උත්සවයක් ද පවත්වන ලදී.

තම කරුනු දොලහේ ක්‍රියාමාර්ගයෙන් කතාවට පමනක් සුලුජාතීන්ගේ අයිතීන් පිලිබඳ සඳහන් කරන ජාහෙළ ප්‍රකාශ කර සිටින්නේ "ශ්‍රී ලංකාවේ රාජ්‍යය, අතීතයේ දී මෙන්, බෞද්ධ මූලධර්ම මත ගොඩ නැගිය යුතු" බවයි. තව දුරටත් ඔවුන් කියා සිටින්නේ, "කිසියම් රටක ජාතික අයිතිය ඇත්තේ එම රට වාසභූමියක් බවට පත් කලා වූ ද, එහි ශිෂ්ඨාචාරය සහ සංස්කෘතිය ගොඩනැගුවා වූ ද ජනතාවට ය" යන පදනම මත, අනෙකුත් සියල්ලනට වඩා ඉහලින් "සිංහල ජාතියේ ජාතික අයිතිය" තහවුරු වී ඇති බවයි.

මෙය, ඉරානයේ මුල්ලාවරුන්ගේ හෝ ඇෆ්ගනිස්ථානයේ තලිබාන් තන්ත්‍රය බඳු පාලනයකට තුඩුදෙන, ප්‍රජාතන්ත්‍ර විරෝධී ආගමික රාජ්‍යයක වට්ටෝරුවයි. ජාහෙළ අර අදින්නේ භික්ෂුමය ධුරාවලියක් මගින් ආන්ඩුවේ පිලිවෙත් විනිශ්චය කෙරෙන බෞද්ධ මූලධර්ම මත පාලනය කෙරෙන රටකට ය. මේ යටතේ අනෙකුත් ආගම් සහ ජනවාර්ගික කන්ඩායම් දෙවන ගනයේ තත්වයට පිරිහෙලනු ලබන අතර ඔවුන් ක්‍රමානුකූල මර්දනයට සහ වෙනස්කම් කිරීම්වලට භාජන කෙරෙනු ඇත.

ජාහෙළ, සිවිල් යුද්ධයෙන් ලාභ උපයාගත් සහ තම පුද්ගලික ජීවිත ගොඩනගාගත් රාජ්‍ය නිලධරයේ සහ මිලිටරි සංස්ථාපිතයේ කොටස්වල ද, ව්‍යාපාරික කොටස්වල ද සැලකිය යුතු මූල්‍යමය හා දේශපාලනික සහයෝගයක් දිනා ගත්තේ ය. එය තම මැතිවරන උද්ඝෝෂනයේ දී, ශ්‍රී ලංකාවේ ප්‍රමිතීන්ට අනුව, අධික ලෙස වියදම් කරනු ලැබුවේ ය. ජාහෙළ අපේක්ෂකයන්ට දිවයින පුරා මැතිවරන කටයුතුවල යෙදීම සඳහා දුසිම් ගනන් වාහන සැපැයුනු අතර, තත්පර 15ක් සඳහා රු.20,000ක් පමන වැයවන රූපවාහිනී වෙලඳ දැන්වීම් නිරතුරුව ප්‍රචාරය කෙරින. ඒ සමග ම රට පුරා සිය දහස් ගනන් පත්‍රිකා සහ පොත් පිංචි බෙදා හැරින.

## වාර්ගික දේශපාලනයේ ඉතිහාසයක්

ජාහෙළ තුල භික්ෂූන්ගේ ප්‍රධානත්වය මගින් 1948 නිදහසේ සිට ශ්‍රී ලංකා රාජ්‍යයේ දෘෂ්ටිවාදාත්මක කඩ ඇනය වූ සිංහල වර්ගවාදය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය තුල බෞද්ධ ධුරාවලිය ඉටුකල අතිමූලික භූමිකාව පිලිබිඹු කෙරේ. යුරෝපීයයන් විසින් හඳුන්වා දෙනු ලැබූ "සමාජමය පාපයන්" සම්බන්ධයෙන් වැලපෙමින්, විභූතිමත් සිංහල අතීතයකට ආපසු ගමන් කිරීමක් කැඳවනු ලැබූ බෞද්ධ පුනර්ජීවනවාදය, ධනපති පන්තිය විසින්, විශේෂයෙන් ම ලංකා සම-සමාජ පක්ෂයේ (ලසසප) වැඩෙන ආනුභාවයට එරෙහිව යොදාගනු ලැබූ ස්වෝත්තමවාදී දේශපාලනයේ අත්‍යන්ත කොටසක් විය.

1953 දී එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව දන ගස්වනු ලැබූ, වර්ජන හා විරෝධතාවලින් සපිරුනු, හර්තාල් ව්‍යාපාරය පරිවර්තනීය ලක්ෂ්‍යයක් සටහන් කලේ ය. ලසසපය විසින් නායකත්වය සපයනු ලැබූ විපක්ෂයේ ශක්තිය ඉදිරියේ ත්‍රස්තවූ පාලක පන්තියේ කොටස්, කුමාරතුංගගේ පියා වන එස් ඩබ් ආර් ඩී බන්ඩාරනායක ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිටුපස තම ශක්තිය ගොනු කලහ. සිංහල භාෂාව එකම නිල රාජ්‍ය භාෂාව බවට පත් කල යුතු බැව් පැවැසෙන ස්වෝත්තමවාදී ඉල්ලීම සහ ජනප්‍රියවාදී සටකපට කථාවන් මත පාදක වෙමින් බන්ඩාරනායක සිංහල ගැමි දුගීන්ට ආයාචනය කලේ ය.

එක්සත් භික්ෂු පෙරමුන යටතේ සංවිධානය වූ බෞද්ධ භික්ෂූහු 1956 මැතිවරනයේදී බන්ඩාරනායකට ඡන්ද හරවා දෙන්නන් ලෙස කටයුතු කලහ. එජාපයේ යුරෝපීයකෘත ප්‍රභූන්ගෙන් සහ ක්‍රිස්තියානියෙන්

බුද්ධාගම ආරක්ෂා කර ගනු වස් ශ්‍රීලනිපයේ ජයග්‍රහනය තහවුරු කරන ලෙස ඉල්ලමින් 12,000ක් භික්ෂූහු රට පුරා ගෙයින් ගෙට යමින් ඡන්ද ව්‍යාපාරයේ යෙදී ගත්හ. ශ්‍රීලනිපය ජයග්‍රහනය කල නමුදු තමා විසින් ම පෝෂනය කරන ලද ප්‍රතිගාමී බලවේගවල ගොදුරක් බවට බන්ඩාරනායක පත්විය. සිංහල බෞද්ධ රාජ්‍යයක් ස්ථාපිත කිරීම සඳහා වැඩිදුර නොයාම සම්බන්ධයෙන් උරනවූ බෞද්ධ භික්ෂුවක් විසින් 1959 දී ඔහු ඝාතනය කෙරින.

ක්‍රමයෙන් සිංහල ස්වෝත්තමවාදයට අනුගත වූ ලසසපය, 1964 දී අගමැති සිරිමා බන්ඩාරනායකගේ ධනේශ්වර හවුල් ආන්ඩුවට එක්වීමෙන් තම සමාජවාදී මූලධර්ම මුලුමනින් ම අත්හලේ ය. ලසසප නායකයින් දලදා මාලිගාවට වැඳ පුදා ගැනීමට සහ බෞද්ධ ධුරාවලියේ ආශීර්වාද ලබා ගැනීමට මහනුවර බලා ගමන් කිරීම මගින් වාර්ගික දේශපාලනයට ඔවුනගේ පරිපූර්න යටත්වීම ඉතා තියුනු ලෙස ප්‍රදර්ශනය විය.

ලසසපයේ පාවාදීම මගින් ස්වෝත්තමවාදී දේශපාලනය ඍජුවම දිරිගන්වනු ලැබින. 1970 සිට 1977 දක්වා පැවති බන්ඩාරනායකගේ දෙවෙනි හවුල් ආන්ඩුවේ කොටස්කරුවන් වූ ලසසපය, බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස ද, සිංහල රාජ්‍ය භාෂාව ලෙස ද නිදන්ගත කෙරුනු වාර්ගික ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වගකිව යුතු ය. දෙමල ජනතාවට එරෙහිව පුලුල්ව පැතිරුනු වෙනස්කම්, උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්ට වෙන් වූ දෙමල රාජ්‍යයක් ඉල්ලා සිටින එල්ටීටීඊය වැනි සන්නද්ධ දෙමල කන්ඩායම් මතුවීමට ඍජුව ම බලපෑවේ ය.

1983 දී කොලඹදී මුදා හැරුනු අති කෲර දෙමල විරෝධී වධ හිංසා මගින් රටෙහි සිවිල් යුද්ධයට අවශ්‍ය වේදිකාව සපයා දුන් එජාප ආන්ඩුව යටතේ රාජ්‍ය අනුදැනීම මත කරන ලද වෙනස්කම් දිගටම කෙරීගෙන ගිය අතර එය තව දුරටත් ගැඹුරු කෙරින. මෙම ව්‍යසනකාරී ගැටුම පුරාවට බෞද්ධ ධුරාවලිය යුද උත්සාහයන්ට පිටුබලය ලබා දුන් අතර සමහර අවස්ථාවල දී හමුදාවට සොල්දාදුවන් බඳවාගැනීම සඳහා ක්‍රියාකාරී ලෙස උද්ඝෝෂනයේ ද යෙදුනේ ය. වඩාත් දක්ෂිනාංශික භික්ෂූන් යුද්ධය සලකනු ලැබුවේ බුද්ධාගමේ සහ "සිංහල ජාතියේ" අනභියෝගී අධිකාරය සහතික කරනු වස් ගෙන යනු ලබන ශුද්ධ යුද්ධයක් ලෙස ය. කවර හෝ සාම උත්සාහයකට හෝ දෙමල සුලුතරයට ලබාදෙන සීමිත හෝ සහනයකට විරුද්ධව බෞද්ධ ධුරාවලියේ කොටස් සිංහල අන්තවාදී සංවිධාන සමග විවිධ පෙරමුනු තැනීම සඳහා තම බලවේග ගොනු කලහ.

අතීතයේදී බෞද්ධ භික්ෂූහු, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන ශ්‍රීලනිපයට හෝ එජාපයට ආධාර කලහ. නැතහොත් ඔවුන් වෙනුවෙන් උද්ඝෝෂය කලහ. දැන් භික්ෂූන් ගෙන් කොටසක්, පවත්නා පක්ෂ කෙරෙන් ජනගහනයෙන් පුලුල් ස්ථරයන් ගැඹුරු ලෙස දුරස්ථවනු දැක ඊට ප්‍රතිචාර ලෙස මෙම දුරස්ථවීම සමස්ථ වසයෙන්ම ප්‍රතිගාමී දිශාවකට හැරවීම සඳහා උත්සාහයක යෙදී සිටී. ජාහෙඋ පිහිටුවීම සඳහා සහ අප්‍රේල් 02 දා මැතිවරනයට සහභාගිවීම සඳහා බෞද්ධ භික්ෂූන් ගන්නා ලද තීන්දුව දේශපාලන සංස්ථාපිතය දෙදරා යාමේ සහ රටේ ගැඹුරුවන දේශපාලන අර්බුදයේ කොටසකි.

සියලු ආගමික මූලධර්මවාදීන් මෙන්ම ජාහෙඋ ද සියලු සමාජ ප්‍රශ්න සදාචාර පරිහානිය මත පටවා ලයි. "දේශපාලනය ශුද්ධ කිරීම" සඳහා සහ "ධර්ම රාජ්‍යයක්" නැවත ස්ථාපිත කිරීම සඳහා සහතික වෙමින් එය ආයාචනනය කරනු ලබන්නේ, විශේෂයෙන් ම, දූෂනය සම්බන්ධයෙන් කලකිරී සිටින සහ සමාජ කැලැඹීම් සම්බන්ධයෙන් බියවැදී සිටින අනාරක්ෂිත සහ අවමංගතවූ මධ්‍යම පන්තික ස්ථරයන්ට ය. එහි ක්‍රියාමාර්ගය, වඩාත් තරගකාරී විදේශීය හා දේශීය සංගත ඉදිරියේ නට්ටන් වෙමින් පවත්නා කුඩා ව්‍යාපාරිකයේ සහ වෙලඳුන්ගේ අවශ්‍යතා සමග ද අනුනාද වෙයි. එහි ආර්ථික වැඩපිලිවෙල, දේශීය ගොවියා සහ ව්‍යවසායකයා මත පාදක වන "ධාර්මික ජාතික ආර්ථිකයක්" කැඳවීමට සීමා වේ.

ජාහෙඋයේ ක්‍රියාමාර්ගය සහ ක්‍රමවේදයන් මුලුමනින්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී වේ. ක්‍රිස්තියානි පල්ලිවලට එරෙහිව ඔවුන් ගෙනයනු ලබන ප්‍රචන්ඩ උද්ඝෝෂනය මගින්, ජාහෙඋ, තම සතුරන් ලෙස දකින කවරෙකුට හෝ විරුද්ධව කායික බිය වැද්දීම් සහ මැරකම් යොදාගැනීමට සූදානම් බැව් පෙන්නුම් කරයි. පසුගිය ඔක්තෝබරයේදී, ජාසස සහ සිඋ, සිංහල දෙමල කලා උලෙලකට විරුද්ධව ද්වේෂ සහගත උද්ඝෝෂනයක් සංවිධානය කරනු ලැබුවේ එම උලෙල එල්ටීටීඊයේ ආධාරක පෙරමුනක් ලෙස හෙලා දකිමිනි. කොලඹ අධිකාරයන් මෙම උලෙල නවතා දැමීමට අසමත්වූ කල ජාසස සහ සිඋ නායකයින් ප්‍රකෝපකරනයක් මගින් තම මැර නඩයක් උලෙල තුලට මුදා හැර කරන ලද කායික ප්‍රහාරයේ දී හතර දෙනෙකුට තුවාල සිදුවිය.

ජාහෙඋ මතුවීමෙන් බෞද්ධ ධුරාවලිය දෙකඩ වූ අතර පාලන කවයන් තුල දේශපාලන නොසන්සුන්තාවයන් නිර්මානය කෙරින. කුමාරතුංගට පිටුබලය සපයන පාලක ප්‍රභූවේ එකී ස්ථර, මෙය සිංහල ඡන්ද කඩා එජාපෙට නැවත බලයට ඒමේ පාර කපන කුමන්ත්‍රනයන් බව පෙන්වීමේ ඉඟි පෑවෝ ය.

භික්ෂූන් ඍජුවම දේශපාලනයට මැදිහත්වීම සම්බන්ධයෙන් නායක භික්ෂූන් සහ මාධ්‍යවල සමහර කොටස් තම විරුද්ධත්වය ප්‍රකාශ කලහ. නිදසුනක් ලෙස *සන්ඩේ ටයිම්ස්* කතුවැකියක් විනීතව මෙසේ ප්‍රකාශ කලේ ය: "ලංකාවේ රජවරුන් තම ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා ධාර්මිකව රට පාලනය කිරීමට අවශ්‍ය අවවාද අනුශාසනා භික්ෂූන්ගෙන් නිරතුරුවම ලබා ගත යුතු විය. අද දින අවශ්‍ය කෙරී ඇති මාවත එයයි. භික්ෂුවක් තෙමේම රජ විය යුතු යැයි කවර තැනක හෝ සඳහන් වී නොමැත."

ජාහෙළ අපේක්ෂකයන් පෙනී සිටින්නාවූ වාර්ගික වැඩපිළිවෙල සම්බන්ධයෙන් හෙළාදැකීම කෙසේ වෙතත් කවර හෝ විවේචනයක් පවා පාලක කව වලින් ඉදිරිපත් නොවුනි. මෙම පරිපූර්න නිශ්ශබ්දතාව මගින් ශ්‍රී ලංකාවේ දේශපාලනයේ නීච රහස පෙන්නුම් කරයි: කොලඹ තුල සමස්ත දේශපාලන සංස්ථාපිතයම කම්කරු පන්තිය බෙදා දුර්වල කිරීම සඳහා, එහි විනාශකාරී ප්‍රතිඵල මුලුමනින්ම නොතකා, සිංහල ස්වෝත්තමවාදය යොදා ගති. ජාහෙළ ට අනභියෝගීව මතුවීමට ඉඩ සැලසූ විෂසෝර දේශපාලන පරිසරය නිර්මානය කිරීමේ වගකීම සියලු දේශපාලන පක්ෂවලට ඍජුවම පැවරේ.

ජාහෙළ ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය මුහුන දෙන අන්තරායන් සම්බන්ධයෙන් තව දුරටත් අනතුරු ඇඟවීමකි. ස්වෝත්තමවාදී හැඟීම් කැලඹීමෙන් සහ ප්‍රජාතන්ත්‍රවිරෝධී අයුරින් එජාපෙ ආන්ඩුව නෙරපා හැරීමෙන්, ජනාධිපති කුමාරතුංග එවකටද පුපුරන සුලු අවස්ථාවක තිබූ දේශපාලන තත්වයට ගිනි අවුලුවනු ලැබුවා ය. අප්‍රේල් 02 මැතිවරනයේ ප්‍රතිඵලය කුමක් වුවත් ඊලඟ ආන්ඩුව ගැඹුරුවන සමාජමය හා දේශපාලනික අර්බුදයකට මුහුන දෙනු ඇත. අතීතයේදී මෙන් ම, තම පාලනයට රැකුල් ගැනීම සඳහා ජාහෙළ වැනි උපකරන බලමුලු ගන්වාගැනීම සම්බන්ධයෙන් පාලක ප්‍රභුව දෙගිඩියා සහගත නොවනු ඇත.

© www.wsws.org